# ඉදිරි පියවර

මහවැලි සංවර්ධන සැලැස්ම වසර තිහකදී අදියර තුනකින් නිම කිරීමට සැලසුම් කෙරුණකි. 1968 මිල ගණන් අනුව මේ සඳහා රුපියල් කෝටි 670 ක් වැය වන බවද, ගණන් බලා තිබුණි. මේ අනුව වැඩ අකුරටම කෙරුණද 1970 පටන් ගත් මහවැලි වැඩ අවසාන වන්නේ විසි එක්වන සියවස උදාවන විටය.

මහවැලි වැඩ නිම කිරීමට එතෙක් බලා නොසිට උපරිම ශක්තිය හා ධනය යොදවා ඉදිරි පස් වස තුළ එය නිම කිරීමට දැන් සැලසුම් යොද ඇත. ආහාර හිඟය, රැකියා විරහිතකම, මෙන්ම පොදු වේ දුප්පත්කම ද දුරලීමට ගතයුතු පියවර මහවැලි වැඩ කඩිනම් කිරීම බව රජයේ අදහසය මේ අනුව අදියර තුනේ මුල් මහවැලි සැලැස්ම වෙනුවට, එහිවූ සැලසුම් සියල්ල පොදු මහවැලි යෝජනා ක්‍රම දෙළහකට ඇතුළත් නව කඩිනම් මහවැලි සැලැස්මක් දැන් සපයා ඇත. දැන් ක්‍රියාත්මක වන්නේ මෙම කඩිනම් සැලැස්මයි. වියදම රුපියල් දස ලක්ෂ 15,000 ක් තරම වෙතැයි ගණන් බලා ඇත.

මහවැලි ගඟ හා මදුරු ඔය ආශ්‍රිතව ජලාශ පහලොවක් ඉදි වනු ඇත. මින් හතරක් මහවැලියේද එකක් මදුරු ඔයේද අනෙක් දහය මහවැලි අතු ගංගාවන්හිද ඉදිවේ, මින් ජලාශ දහතුනක් වාරි කටයුතුවලට අමතරව ජල විදුලිබලය නිපදවීමට උප යෝගී වනු ඇත.

පොල්ගොල්ල, වික්ටෝරියා, රොතලවෙල, හා රන්දෙණිගල මහවැලියේ බිහිවන ජලාශයන්ය. බෝවතැන්න හා මොරගහකන්ද අඹන් ගඟින් බිහිවන ජලාශයන් දෙකය. සෙසු ජලාශ මෙසේය.

| | | |
|---|---|---|
| උල්හිටිය ජලාශය | .. | උල්හිටිය ඔය |
| කල්දෙන | .. | බදුලු ඔය |
| කොත්මලේ | .. | කොත්මලේ ඔය |
| කළු ගඟ | .. | කළු ගඟ |
| පල්ලේවෙල | .. | ලොග්ගල් ඔය |
| හීන් ගඟ | .. | හීන් ගඟ |
| ඉහළ හා පහළ උමා ඔය | .. | උමා ඔය |
| මදුරු ඔය | .. | මදුරු ඔය |

**වික්ටෝරියා ව්‍යාපාරය;-** තෙල්දෙණිය නගර යට සැතපුම් දෙළහක් දුරින් පිහිටි වික්ටෝරියා දිය ඇල්ලට ඉහළින් බැඳෙන වේල්ලකින් වික්ටෝරියා ජලාශය ඉදිවනු ඇත. අඩි 338 උස අඩි 1,400 දිග වේල්ල නිසා බිහිවන ජලාශයේ ධාරිතාව අක්කර අඩි 415000 කි. වික්ටෝරියා ජල විදුලි බලාගාරයෙන් මෙගවොට් 120 ක විදුලි බලයක් නිපදවනු ඇත. අඩි 14,720 දිග, අඩි 21 විශ්කම්භය ඇති උමඟකින් විදුලි බලාගාරය වෙත ජලය ගෙන යනු ඇත.

වික්ටෝරියා ව්‍යාපාරයෙන් අළුත් ඉඩම් අක්කර 73,600 කට පරණ ඉඩම් අක්කර 3,300 නිරතුරු ජලය සැපයෙනු ඇත. මුළු වියදම රුපියල් දශලක්ෂ 740 කි.

**රන්දෙණිගල ව්‍යාපාරය;-** වික්ටෝරියා ජලාශයට සැතපුම් දහතුනක් පහළින්, මිනිපේ අමුණට සැතපුම් හතරක් ඉහළින් මහවැලි නදියේ ඉදිවන රන්දෙනිගල ජලාශය වික්ටෝරියා ජලාශයෙන් ගලා එන ජලය යළි පාලනය කොට බෙදහරිනු ඇත. අක්කර 1,30,300 ක් මින් ජලය සැපයෙනු ඇත. අඩි 277 ක් උස, අඩි 1,730 ක් දිග වේල්ල නිසා බිහිවන ජලාශයේ ධාරිතාව අක්කර අඩි 6,29,000 කි.


වේල්ල පහළින් වම් ඉවුරේ මෙගවොට් 25 ක විදුලි බලාගාරයක් ඉදිවනු ඇත. මුළු වියදම රුපියල් දශ ලක්ෂ 700 කි.

**මොරගහකන්ද ව්‍යාපාරය:** බෝවතැන්න ජලාශයට සැතපුම් දහයක් පහළදී අඹන් ගඟ හරහා බැඳෙන වේල්ලකින් මෙම ජලාශය ඉදිවනු ඇත. සම්පූර්ණ දිග අඩි 5,070 කි. දඹුල්ල සිට වේල්ලට දුර සැතපුම් 20 කි. ජල ධාරිතාව අක්කර අඩි 6,92,000 කි. වේල්ල පාමුල ඉදිවන විදුලි බලගාරය මෙලවොට් 40 ක විදුලි බලය නිපදවීමට සමත්ය.

රුපියල් දස ලක්ෂ 560 ක වියදමින් ඉදි වන මොරගහකන්ද ව්‍යාපාරයෙන් අක්කර 1.30,300 කට ජලය සැපයෙනු ඇත. කවුඩුල්ල කන්තලේ හා පරාක්‍රම සමුද්‍රය යටතේ ඇති ඉඩම්වලට ජල සැපයුමද මෙම ජලාශය මඟින් තහවුරු කරනු ඇත. උතුරු මැද පළාතේ මහ ඇලටද මොරගහකන්දෙන් ජලය සැපයෙනු ඇත.

**කොත්මලේ ඔය ව්‍යාපාරය;** පොල්ගොල්ල හැරවුමට සැතපුම් විසි පහක් පමණ ඉහළින් කොත්මලේ ඔය හරහා ඉදිවන වේල්ලකින් කොත්මලේ ජලාශය ඉදි වේ. මහවැලි අතු ගංගාවක්වන කොත්මලේ ඔය ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ විදුලි බලය නිපදවීමය.

## මහවැලි කඩිනම් වැඩසටහන



අඩි 1,927 ක් දිග, අඩි 356 ක් උස වේල්ල නිසා සෑදෙන ජලාශ ධාරිතාව අක්කර අඩි 3,20 000 කි. සෙසු මහවැලි ව්‍යාපාරවල ජල අවශ්‍යතා මනාව හැසිරවීමට කොත්මලේ ජලාශය උපකාරී වනු ඇත. කොත්මලේ ජලාශය නිසා පොල්ගොල්ලෙන් හැරවෙන ජල ප්‍රමාණය අක්කර අඩි 2,50,000 කින් වැඩි වනු ඇත. පොළොව යට ඉදි කෙරෙන විදුලි බලාගාරය මෙගාවොට් 150 ක් ජනනය කිරීමට සමත්ය. ඇස්තමේන්තුව ඇති වියදම රුපියල් දස ලක්ෂ 1,035 කි.

**උල්හිටිය ව්‍යාපාරය:** අලුත්නුවර පදියතලාව පාරට සැතපුම් දහයක් නුදුරින් පිහිටි මහවැලි අතු ගංගාවක් වන උල්හිටිය ඔය හා එහි අතු ගංගාවක් වන රත්කඳ ඔය හරහා බැඳෙන අඩි 4,700 හා 4,000 වේලි නිසා උල්හිටිය ජලාශය සෑදේ. ජලාශ ධාරිතාව අක්කර අඩි 88,000 කි. දශ ලක්ෂ 60 ක් වැය වන උල්හිටිය ව්‍යාපාරය වික්ටෝරියා ව්‍යාපාරයේ දකුණ ඉවුර අසල පද්ධතියේ කොටසක් ලෙස සැළකිය යුතුය.

**මදුරු ඔය ව්‍යාපාරය:** පොලොන්නරුව වැලිකන්දට සැතපුම් දෙළහක් දුරින් ඉදි වන මදුරු ඔය ව්‍යාපාරය ඉපැරණි හෙළ වාරි විස්කම්වල පදනමක් රටට හෙළි කොට ඇත. ඉපැරණි වේල්ල තිබූ තැනම නුදුරින් ඉදිවන නව වේල්ලෙන්, අක්කර අඩි 3,24,500 ක් දැරිය හැකි ජලාශයක් බිහි වනු ඇත. උල්හිටිය ඔයෙන් ඇරඹෙන මිනිපේ දකුණු ඉවුර ඇල අවසානයේ වන උමගකින්ද මදුරු ඔය ජලාශයට ජලය සැපයෙනු ඇත. දස ලක්ෂ 190 ක් වැය වන මදුරු ඔය ව්‍යාපාරයෙන් අක්කර 1,24.900 කට ජල පහසුව සැපයෙනු ඇත. මෙගාවොට් 45 විදුලි බලාගාරයක්ද මෙහි ඉදිවනු ඇත.

**සෙසු ව්‍යාපාර;**

**තල්දෙන ජලවිදුලි ඒකකය:** බදුලුඔයේ ජලය පාලනය කර විදුලි බල ඒකකයක් පිහිටුවීමට ඉඩ සැලසෙන අයුරින් තල්දෙන ඒකකය සැලසුම් කර ඇත එය හරහා ඉදිවන වේල්ලෙන් සෑදෙන ජලාශයේ ධාරිතාව අක්කර අඩි 56,000 කි. විදුලිය නිපදවීමෙන් පසු ජලය ලොග්ගල් ඔයේ බිහිවන පල්ලේවෙල ජලාශයට යවනු ඇත.

මෙගාවොට් 145 ක විදුලියක් ජනනය කරනු ඇත. වියදම දස ලක්ෂ 170 කි.

**උමා ඔය ව්‍යාපාරය:** රන්දෙනිගල ජලාශයට පහළින්, මිනිපේ අමුණට ඉහළින් මහවැලි ගඟට එක්වන උමා ඔය ඇසුරෙන් මහවැලි ව්‍යාපාර දෙකක් බිහිවේ. **ඉහළ උමා ඔය ව්‍යාපාරය** හාලි ඇලට සැතපුම් දෙකක් නුදුරින් උමාඔය හරහා බැඳෙන වේල්ලකින් අක්කර අඩි 52,000 ක ජලාශයක් බිහි වෙයි. වේල්ලට සැතපුම් 3 1/2 ක් පහළින් මෙගාවොට් 255 ක ජල විදුලි බලාගාරයක් ඉදිවේ. අඩි 15,000 ක් දිග උමඟකින් ඒ වෙත ජලය ගෙන එනු ලැබේ. ජලාශයෙන් පිට වන ජලය අවසානයේ පහළ උමා ඔය හරහා දකුණු ඉවුර ඇල මගින් වාරි කටයුතු වලට ගනු ඇත. වියදම දස ලක්ෂ 420 යි.

**පහළ උමා ඔය;** ඉහළ උමා ඔය ඒකකයට සැතපුම් 13 ක් පහළින් බදුල්ලට සැතපුම් 23 ක් දුරින් ඉදිවන පහළ උමා ඔය ජලාශය හා විදුලි බලාගාරයට දස ලක්ෂ 260 ක් වැය වනු ඇත. ජලාශ ධාරිතාව අක්කර අඩි 30,000 යි. විදුලි බලගාරය මෙගවොට් 30 ක විදුලිය ජනනය කරනු ඇත.

**කළු ගඟ ඒකකය:** කළු ගං ඒකකය මාතලේ සිට සැතපුම් 35 ක් දුරින් පිහිටි අඹන් ගඟේ අතු ගඟක් වන කළු ගඟ ඇසුරින් ඉදිවේ. මෙය මෙගවොට් 1.9 ක විදුලි බලාගාරයක් ඇති වාරි ජලාශයක් වනු ඇත. ජලාශය අක්කර අඩි 2,03 000 ක් රඳවා ගැනීමට සමත්ය: ජලය වැඩි ප්‍රමාණයක් ඇලහැර හැරවුම් ඒකකට යොමු කෙරෙනු ඇත. වියදම දසලක්ෂ 175 යි.

**පල්ලේවෙල ඒකකය;** බදුල්ල කරමැටිය පාරේ 18 වන සැතපුමට ආසන්නයේ ලොග්ගල් ඔයේ බිහිවන පල්ලේවෙල ඒකකය අක්කර අඩි 57,000 ක ජලාශයකින් හා මෙගවොට් 10 ක විදුලි බලාගාරයකින් සමන්විත වනු ඇත. වික්ටෝරියා-රන්දෙනිගල ව්‍යාපාර යටතේ දකුණු ඉවුර ඇල ජල සැපයුම පල්ලේවෙල ඒකකයෙන් සහතික කරනු ඇත. වියදම දස ලක්ෂ 230 යි.

**හීන් ගඟ ඒකකය:** මහවැලි අතු ගඟක් වන හීන් ගඟෙහි පල්ලේවෙලට සැතපුම් 12 ක් දුරින් හීන් ගඟ ඒකකය බිහිවේ. හීන් ගඟ ජලාශයෙන් අක්කර අඩි 1,60,000 ක ප්‍රමාණයක් රන්දෙණිගල ජලාශයෙන් දකුණු ඉවුර ඇලට සැපයෙන ජල කඳ තහවුරු කිරීමට යොදවනු ඇත මෙගවොට් 7.1 ක විදුලි බාලාගාරයක්ද මෙහි ඉදිවනු ඇත. වියදම දස ලක්ෂ 230 යි.

**රොතලවෙල ඒකකය;** මහවැලියේ බිහි වන අවසාන ජලාශය රොතලවෙලයි. මිනිපේ දකුණු ඉවුර අහල මහදිගේ මෙහි ගිය හැක පල්ලේගම සිට සැතපුම 25 ක දුරය. රොතලවෙල ජලාශයෙන් මහවැලි "ඒ" කලාපය ලෙසින් හැඳින් වෙන කන්දකාඩු අමුනේ වම හා දකුණු ඉවුර මායිම් වන ප්‍රදේශයේ අක්කර 1,14,000 කට පමණ ජලය සැපයේ. සෝමවතී, නොමගනාවවී හා සේරුවාවිලද මේ පෙදෙසට අයත්ය. වියදම් දස ලක්ෂ 130 යි.